ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No . | දිනය<br>திகதி<br>Date. 2025.05.05 |

යූ.ජී. දිල්කා ශිරෝමලී සෙනෙවිරත්න
B.4, මරියාවත්ත,
ගම්පොල.

**පැමිණිලිකාර පාර්ශවය**

එච්.එම්.ඉලංගකෝන් බංඩා

**වින්දිත පාර්ශවය**

1. පො.ප.කුමාරසිංහ
   ස්ථානාධිපති,
   දූෂණ මර්ධන අංශය,
   මූලස්ථාන පොලිස් ස්ථානය,
   ගම්පොල.

2. පො.සැ.66560 පැතුම්
   මූලස්ථාන පොලිස් ස්ථානය,
   ගම්පොල.

3. පො.කො.79375 චින්තක
   මූලස්ථාන පොලිස් ස්ථානය,
   ගම්පොල.

4. පො.කො.103735 ජයසිංහ
   මූලස්ථාන පොලිස් ස්ථානය,
   ගම්පොල.

5. බී.ඩී.පී. ලක්සිරි ප්‍රනාන්දු
   මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක,
   මූලස්ථාන පොලිස් ස්ථානය,
   ගම්පොල.

**වගඋත්තරකාර පාර්ශවය**

**<u>පැමිණිලි අංකය:- HRC/KND/164/24-A</u>**

**<u>පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>**

පැමිණිලිකාර පාර්ශවය වන යූ.ජී. දිල්කා ශිරෝමලී සෙනෙවිරත්න යන අය විසින් 2024.03.18 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් කියා සිටින්නේ ගම්පොල,



| | | | | |
|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office | අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04.<br>இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04.<br>No. 14, R.A.De Mel Mawatha, Colombo -04. | සභාපති<br>தவிசாளர்<br>Chairman 011- 2505451 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax 011- 2505541/74 | ඊමේල්<br>மின்னஞ்சல்<br>e-mail sechrcsl@gmail.com |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 94-11-2505580 / 81 /82 | ලේකම්<br>செயலாளர்<br>Secretary 011- 2505521 | ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline 1996 | වෙබ්<br>இணையம்<br>Web www.hrcsl.lk |

මරියාවත්ත, B.4 ලිපිනයේ පදිංචි ඇයගේ ස්වාමිපුරුෂයා වන එච්.එම්. ඉලංගකෝන් බංඩා (වින්දිත පාර්ශවය) විශ්‍රාමික හමුදා සෙබලෙකු වන බවත්, ඔහු අවුරුදු 22ක කාලයක් 2 වන රයිෆල් බලකායේ සේවයෙහි නිරත වෙමින් යුධ හමුදාවේ ක්‍රියාන්විත වලට සම්බන්ධ වී සේවය කර දැනට විශ්‍රාමිකව සිටින රණ විරුවෙක් බවත්, මේ වන විට මොරගොල්ල ව්‍යාපෘතියේ සේවය කරමින් තමාගේ ජීවිතය පාඩුවේ ගත කරමින් සිටින බවත් ය.

2024.03.14 වන දින ඔහු සේවයට ගොස් හවස නිවසට පැමිණ තම දරුවන් සමඟ කාලය ගත කරමින් සිටි බවත්, ඔහු මහන්සි වී වැඩකර පැමිණෙන නිසා රාත්‍රියට මත්පැන් (බියර්) ටිකක් පානය කරන අතර එයින් කාටවත් කරදරයක් නොමැති බවත් පැමිණිලිකාරිය විසින් සඳහන් කර ඇත. එසේම, එදින පැමිණිලිකාරිය විසින් සියලු වැඩ නිමා කර නිවසේ කාමරයට වී සිටින අතර හදිස්සියේම කවුරු හෝ කෙනෙක් ඇය සිටි කාමරයට එබිකම් කරමින් සිටිනා බව ඇය දුටුව බවත්, එවිට ඇයගේ ස්වාමිපුරුෂයා නිවසේ මුළුතැන්ගෙය දෙස සිට පැමිණෙන විට එබිකම් කරමින් සිටි පුද්ගලයා දැක කවුද කියා අසා ඇයි මෙහෙම ගෙවල් වලට පැමිණ ගැහැනු සිටින කාමරවලට එබිකම් කරන්නේ මොකද යැයි ඇසූ බවත්, එම අවස්ථාවේදී ඔහු හා තම ස්වාමිපුරුෂයා අතර බහින් බස් වීමක් ඇති වූ බවත් පැමිණිලිකාරිය විසින් ප්‍රකාශ කර ඇත.

ඉන්පසුව එම පුද්ගලයා මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය වන තම ස්වාමිපුරුෂයා හට පහරදෙමින් නිවසින් පිටතට ඇදගෙන ගිය බවත්, තමා ද ඔවුන් පසුපසින් ගමන් කළ බවත්, තම දරුවන් දෙදෙනා කාමරයේ අඬමින් සිටි බවත් පැමිණිලිකාරිය විසින් දක්වා ඇත. එසේම, නිවසින් පිටත සිටි තවත් අයෙකු විසින් පාරේදි තම ස්වාමිපුරුෂයාට පහර දුන් බව දුටු බවත්, ඔවුන් සියලු දෙනාම තම ස්වාමිපුරුෂයාව පිටත සිට යළි නිවස ඇතුලට ඇදගෙන ඇවිත් පුටුවක හාන්සිකරවා පහර දුන් බවත්, එවිට "අපේ මහත්තයාට පහර දෙන්න එපා" යැයි තමා කෑගැසූ බවත්, එවිට "තෝ කට වහගෙන හිටපිය බැල්ලියේ" යනුවෙන් තමා හට බැන වැදුණු බවත්, තම ස්වාමිපුරුෂයාට පහරදෙමින් සිටි දෙදෙනා විසින් "තොට හොඳ වැඩක් කරන්නම්, බලාගෙන හිටපන්කෝ තොට කරන දේ, තෝ අපි ගැන දන්නේ නැද්ද යකෝ, අපි ලයිසන් ගත්ත වන්ඩියෝනේ" යනුවෙන් ස්වාමිපුරුෂයා හට පැවසූ බවත් පැමිණිලිකාරිය විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

තවද, තම ස්වාමිපුරුෂයා හට අසනීප තිබෙන බැවින් ඔහුට පහරදෙන්න එපා යැයි කෙතරම් පැවසුව ද, එක් අයෙකු තම ස්වාමිපුරුෂයාගේ පපුවට අත්දෙකින්ම පහර දුන් බවත්, අනෙක් පුද්ගලයා නිවස තුළට දිවගොස් පොල්ලක් රැගෙනවිත් එයින් තම ස්වාමි පුරුෂයා හට පහර දුන් බවත්, "තෝ දැනගනින් ගෑනියේ තොගේ මිනිහව මාස හයකට වත් තොට දැකගන්නට ලැබෙන්නේ නැහැ. තොපි දන්නේ නෑ අපිට කරන්න පුලුවන් දේ" යනුවෙන් තමාට ද පැවසූ බවත් පැමිණිලිකාරිය විසින් සඳහන් කර ඇත.

එමෙන්ම, එලෙස පහරදීම් සිදු කරන අවස්ථාවේ දී තම ස්වාමිපුරුෂයා විසින් තම පුතාට අඬගසා "පුතේ ඇවිත් රෙකෝඩ් කරගන්න" යනුවෙන් පැවසූ බවත්, එවිට දුව සහ පුතා පැමිණිවිට ස්වාමිපුරුෂයාට

පහරදෙමින් සිටි දෙදෙනා විසින් තම දරුවන් දෙදෙනාට බැන වැදී එලවා දැමූ බවත්, දරුවන් දෙදෙනා අඩමින් නිවස තුළට දුව ගිය බවත් පැමිණිලිකාරිය විසින් ප්‍රකාශ කර ඇත.

මෙලෙස තම ස්වාමි පුරුෂයා හට පහර දුන් පුද්ගලයින් දෙදෙනා පොලිස් නිලධාරීන් බව මුලදී තමා දැන නොසිටිය බවත්, ඔවුන් සිවිල් ඇඳුමෙන් සැරසී පැමිණ සිටි බවත්, පහරදීමෙන් අනතුරුව ගම්පොළ පොලිස් ස්ථානයේ ජීප්රිය පැමිණි පසු තම ස්වාමිපුරුෂයා බිම දිගේ ඇදගෙන ගොස් ජීප්රිය තුළට දමා ගත් බවත් පැමිණිලිකාරිය විසින් සඳහන් කර ඇත. තවද, තම ස්වාමි පුරුෂයා පොලිස් සථානය වෙත රැගෙන යාමෙන් අනතුරුව 1 වන වගඋත්තරකරු වන පු.පො.ප.කුමාරසිංහ නැමැති නිලධාරියා විසින් ස්වාමි පුරුෂයා හට පහර දී රා කලයක් හිසේ සිට නැවීමට කටයුතු කළ බව තම ස්වාමි පුරුෂයා බැලීමට ගම්පොළ පොලිස් ස්ථානය වෙත ගිය පසුව ස්වාමි පුරුෂයා විසින් පැවසූ බව ද පැමිණිලිකාරිය විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

<u>වින්දිත පාර්ශවයේ කරුණු දැක්වීම</u>

ඉහත නම් සඳහන් පැමිණිලිකාරියගේ ස්වාමි පුරුෂයා වන එච්.එම්. ඉලංගකෝන් බණ්ඩා යන වින්දිත පාර්ශවය බන්ධනාගාරයෙන් ඇප පිට නිදහස් වීමෙන් පසු කොමිෂන් සභාව වෙත 2024.07.08 වන දිනැතිව ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශය මඟින් කියා සිටින්නේ, ගම්පොළ, මරියවත්ත, අංක B.4 දරණ ලිපිනයේ පදිංචි එච්.එම්. ඉලංගකෝන් බණ්ඩා වන තමන් යුධ හමුදා සේවයේ විශ්‍රාමික සෙබලෙකු වන බවත්, 2024.03.14 වන දින ගම්පොළ මොරගොල්ල ජල ව්‍යාපෘතියේ සේවයට ගොස් ප.ව.6.30ට නිවසට පැමිණි බවත් ය.

එදින රාත්‍රි 8.45 පමණ තමා නිවස තුලට පැමිණි අවස්ථාවේ තමන්ගේ නිදන කාමරය අසල නාඳුනන පුද්ගලයෙක් සිටි බවත්, තමන් එම පුද්ගලයාගෙන් ප්‍රශ්න කළ බවත්, එවිට "තමුන් කවුද කියා උඹට දැන ගන්න ඕනද, පෙන්නපන් මස්සිනාගේ කාමරය" ලෙස පැවසූ බවත්, තමන් එය පෙන්වූ බවත්, එම අවස්ථාවේ දී ඇතිවූ බහින් බස් වීමකදි තමන්ගේ බිරිඳ සහ ළමයි දෙදෙනා ඉදිරියේදි තමන්ට පහර දී බෙල්ල තද කරගෙන නිවසින් පිටතට රැගෙන ගොස් තමන්ව නිවස ඉදිරිපිට පාරේ දමා ඊට ඉදිරියෙන් තිබූ ත්‍රීවිල් රථයක් වෙත එම නාඳුනන පුද්ගලයා දිවගිය බවත් වින්දිත පාර්ශවය විසින් සඳහන් කර ඇත.

පසුව ත්‍රීවිල් රථයේ සිටි තවත් පුද්ගලයෙකු එම නාඳුනන පුද්ගලයා සමග පැමිණ තමන්ට පහර දි නැවත නිවස තුලට ඇදගෙන ඇවිත් හාන්සි පුටුවකට දමා නාඳුනන පුද්ගලයන් දෙදෙනාම තමන්ට අමානුෂික ලෙස පහර දුන් බවත්, තමන්ව හාන්සි පුටුවට දමා හිර කර එම පුද්ගලයින් දෙදෙනා අතරින් එක් අයෙකු නිවස තුළට දිවගොස් 2x2 පොල්ලක් රැගෙනවිත් අමානුෂික ලෙස තමා හට පහර දුන් බවත්, එම අවස්ථාවේ දී තම දරුවන් දෙදෙනා සහ බිරිඳ එම ස්ථානයේ සිටි බවත්, තම පුතා විසින් මෙය වීඩියෝ කිරිමට උත්සහ කළ අතර ඒ වෙලාවේ එකී නාඳුනන පුද්ගලයින් දෙදෙනා විසින් දරුවන් දෙදෙනා හට පරුෂ වචනයෙන් බැණ එළවා ගත් බවත්, දරුවන් දෙදෙනා අඬමින් නිවස තුළට ගිය බවත් වින්දිත පාර්ශවය විසින් ප්‍රකාශ කර ඇත.

එකී නාඳුනන පුද්ගලයින් දෙදෙනා පැමිණ තිබුණේ රතුපාට පුද්ගලික ත්‍රීරෝද රථයක වන බවත්, එක් පුද්ගලයෙකු දුරකථන ඇමතුමක් ගෙන පොලිස් ස්ථානයෙන් ජීප් රථයක් මරියාවත්ත ෆාමසිය ළඟට එවන ලෙස පැවසූ බවත්, එවිට එම පුද්ගලයන් දෙදෙනා පොලිස් නිලධාරීන් වන බව තමා දැනගත් බවත්, එලෙස පැමිණ තිබුණේ ගම්පොළ මූලස්ථාන පොලිස් ස්ථානයේ දූෂණ මර්ධන ඒකකයේ ස්ථානාධිපති පො.ප. කුමාරසිංහ සහ පැතුම් යන නිලධාරීන් දෙදෙනා වන බවත්, පොලිස් ස්ථානයෙන් ජීප් රථයක් පැමිණි පසු තමා පුටුවෙන් ඇද බිමට දමා බිම දිගේ ඇදගෙන ගොස් ජීප් රථයේ පසුපස දොරින් ජීප් රථය තුළට උස්සා විසි කළ බවත්, මාර්ගයේ සිටි මිනිසුන් ගොඩාක් තමා දෙස බලාගෙන සිටි බවත්, නිවස තුළදී තම බිරිඳ විසින් “ඇයි මාගේ ස්වාමියා ගෙන යන්නේ” යැයි අසා ඇති බවත්, එවිට ඔවුන් විසින් “මේක මහගෙදරනේ, එම නිසා රැගෙන යනවා” යනුවෙන් පවසා ඇති බවත් වින්දිත පාර්ශවය විසින් දක්වා ඇත.

මේ අවස්ථාවේ දී තම බිරිඳගේ සහෝදරයා ද පොලිස් ස්ථානය වෙත රැගෙන ගිය බවත්, 2 වන වගඋත්තරකරු වන පො.සැ. 66560 පැතුම් යන නිලධාරියා විසින් තමාගේ සියලු ඇඳුම් ගලවා දමා යකඩ පොල්ලකින් අමානුෂික අයුරින් පහර දුන් බවත්, පහර දී රා බුලියක් ගෙන ඔලුවට හැලූ බවත්, රාත්‍රී 12.00 ට පමණ තමා හට ඇඳුම් අන්දවා පොලිස් කූඩුවට දැමූ බවත් වින්දිත පාර්ශවය විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

2024.03.15 දින උදේ 8.00ට පමණ තමාගෙන් බලෙන් අත්සන් ලබා ගැනීමට උත්සහ කළ බවත්, තමන් කිසිවකට අත්සන් නොකළ බවත්, කිසිවකට ඇඟිලි සලකුණු නොතැබූ බවත්, තමා විසින් කිහිප වතාවක්ම තමන් සිදු කළ වරදක් කුමක්දැයි පොලිස් නිලධාරීන් ගෙන් ඇසූ නමුත්, තමා හට ඊට පිළිතුරක් නොලැබුණු බවත්, තම බිරිඳගේ සහෝදරයා ළඟ ගංජා තිබී ඇති බවත්, එහෙත් තමා කිසිදු වරදක් සිදු කර නොමැති බවත්, 2024.03.05 වන දින මාංචු දමා තමා සහ බිරිඳගේ සහෝදරයා අධිකරණය වෙත රැගෙන ගිය බවත්, එදින පෙ.ව. 11.00ට පමණ බිරිඳගේ සහෝදරයා හට ඇප ලබා දුන් බවත්, පසුව තමා විසින් හෙරොයින් මි.ග්‍රෑ. 2100 ළඟ තබා ගෙන සිටි බවට අසත්‍ය චෝදනාවක් ගොනුකර අධිකරණයට ඉදිරිපත් කර තිබූ බවත්, තමන් විසින් සිදු වූ සියළු දේ ගරු අධිකරණයට පැවසූ බවත්, එවිට තමාව අධිකරණ වෛද්‍ය නිලධාරිතුමාට ඉදිරිපත් කරන ලෙසට අධිකරණය විසින් නියෝග කළ බවත් වින්දිත පාර්ශවය විසින් ප්‍රකාශ කර ඇත.

එදිනම අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව තමා පල්ලෙකැලේ බන්ධනාගාරයට රැගෙන ගිය බවත්, දින 102 ක් රක්ෂිත බන්ධනාගාර ගතව සිටි බවත්, එහි සැක අංක 1950 යටතේ මාස දෙකහමාරක් පමණ බන්ධනාගාර රෝහලෙන් වෛද්‍ය ප්‍රතිකාර ලබාගත් බවත්, පොලිස් නිලධාරීන්ගේ පහර දීම් නිසා තවමත් තමා අසනීපව සිටින බවත්, 2024.06.27 වන දින ගරු අධිකරණයෙන් ඇප ලබා නිවසට පැමිණි බවත් වින්දිත පාර්ශවය විසින් සඳහන් කර ඇත.

## වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම

### 1 වන වගඋත්තරකරු වන පො.ප. කුමාරසිංහ යන අයගේ කරුණු දැක්වීම

1 වන වගඋත්තරකරු වන පො.ප. කුමාරසිංහ යන අය විසින් 2024.08.20 දිනැති දිවුරුම් ප්‍රකාශයක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර සිටින්නේ ඔහු ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ පොලිස් පරීක්ෂකවරයෙකු ලෙස දැනට ගම්පොළ මූලස්ථාන පොලිස් ස්ථානයේ දූෂණ මර්ධන අංශයේ ස්ථානාධිපති ලෙස සේවය කරන බවත්, 2024.03.14 වන දින මූලස්ථාන පොලිස් පරීක්ෂකතුමාගේ නියෝග පරිදි පැය 17.50ට පො.කො. 79375 වින්තක සහ පො.සැ. 66560 පැතුම් යන නිලධාරීන් සමග අංක WP ABV 2584 දරණ ත්‍රීවිල් රථයෙන් වැටලීම් රාජකාරි සඳහා ගම්පොළ නගරයට පිටත්ව ගිය බවත් ය.

එසේම ඉහත කී නිලධාරීන් සමඟ ගම්පොළ නගරයේ කීරපන හා කහටපිටිය යන ප්‍රදේශ වල සංචාරය කරමින් සිටියදී පැය 18.20ට ගම්පොළ මරියවත්ත ප්‍රදේශයේ ගංජා ළඟතබා ගෙන සිටින පුද්ගලයෙක් පිළිබඳව පුද්ගලික ඔත්තුකරුවකුගෙන් තමා වෙත තොරතුරක් ලැබුණු බවත්, ඒ අනුව නිලධාරීන් කණ්ඩායම මරියවත්ත ප්‍රදේශයට පිටව ගිය බවත්, එහිදී නිශ්කාර්ගේ පළතුරු කඩේ අසළ සිටියදී පැය 20.30ට ගංජා ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 700 ළඟතබා ගත් වරදට ගම්පොළ, මරියවත්ත, අංක බී/4හි පදිංචි කමල් අතුල සෙනෙවිරත්න නොහොත් ලොක්කෙ යන සැකකරුව වරද කියාදී තමා විසින් අත්අඩංගුවට ගත් බවත්, එම සැකකරුගෙන් වැඩිදුරටත් ප්‍රශ්න කිරීමේදී ඔහුගේ මස්සිනා වන හේරත් මුදයන්සේලාගේ ඉලංගකෝන් බණ්ඩා හෙවත් මජී යන අය හෙරොයින් ජාවාරමේ නිරත වන බවට කරුණු අනාවරණය කරගත් බවත් 1 වන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත.

තවද, ඉහත කී සැකකරුගෙන් ලද තොරතුරු මත පො.කො. 79375 වින්තක, පො.කො. 103735 ජයසිංහ සහ පො.සැ. 66560 පැතුම් යන නිලධාරීන් සමග තමා ගම්පොළ, මරියවත්ත, බී/ 4 යන ලිපිනයේ පදිංචි හේරත් මුදියන්සේලාගේ ඉලංගකොන් බණ්ඩා හෙවත් මජී පරීක්ෂා කිරීම සඳහා ඔහුගේ නිවස තුළට ඇතුළු වූ බවත්, එම අවස්ථාවේදී ඉලංගකෝන් බණ්ඩා යන සැකකරු නිවසේ සාලයේ සිටි බවත්, තමා විසින් ඔවුන් ගම්පොළ පොලිස් ස්ථානයේ නිලධාරීන් බවට ප්‍රකාශ කරන ලද බවත්, ඉලංගකෝන් බණ්ඩා යන සැකකරුව තමා විසින් පරීක්ෂා කිරීමේදී ඔහුගේ කලිසමේ ඉදිරිපිට දකුණු සාක්කුවේ තිබූ රෝස පාට ෂොපින් කැබැල්ලක ඔතන ලද කුඩා පාර්සලයක් සොයාගත් බවත්, එය හෙරොයින් ලෙස තමා විසින් හඳුනාගත් බවත් 1 වන වගඋත්තරකරු විසින් සිය දිවුරුම් ප්‍රකාශය තුළ සඳහන් කර ඇත.

ඒ අනුව තමා විසින් හෙරොයින් තබාගත් වරද කියාදී හේරත් මුදියන්සේලාගේ ඉලංගකෝන් බණ්ඩා යන සැකකරු ප.ව. 20.45ට ඔහුගේ නිවස තුළදී අත්අඩංගුවට ගත් බවත්, එම අවස්ථාවේදී එකී සැකකරු තමාගේ ටීෂර්ට් එකෙන් අල්ලා ප්‍රතිරෝධය පෑ බවත්, පසුව සැකකරු නිවසේ සාලයේ තිබූ පුටුවක් බදාගෙන පුටුවේ ඔළුව හප්පාගත් බවත්, නිලධාරීන්ට පයින් ගසා තල්ලු කර පළායාමට උත්සාහ කළ බවත්, තමා ඇතුළු නිලධාරී කණ්ඩායම මහත් පරිශ්‍රමයක් දරා ඉහත කී සැකකරු සහ ඔහුගේ මස්සිනා වන

අතුල යන අයව නිලධාරීන් පැමිණි ත්‍රීවීල් රථයට නංවාගෙන පොලිස් ස්ථානය වෙත රැගෙන ආ බවත් 1 වන වගඋත්තරකරු විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

එලෙස අත්අඩංගුවට ගන්නා ලද සැකකරු වන ඉලංගකෝන් බණ්ඩා යන අයගේ ප්‍රකාශයක් පො.සැ. 66560 පැතුම් යන නිලධාරියා විසින් සටහන් කරගෙන ඇති බවත්, එම ප්‍රකාශය තුළින් එකී සැකකරු හෙරොයින් ජාවාරමේ නිරත වන බවට පිළිගෙන ඇති බවත්, එකී සැකකරු 2024.03.15 වන දින නඩු අංක බී/321/24 යටතේ ගම්පොළ මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද බවත්, පසුව අධිකරණය මගින් ඔහුව අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කළ බවත් 1 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත.

තවද, තමා ඇතුළු නිලධාරී කණ්ඩායම විසින් ඉහත කී සැකකරු වන ඉලංගකෝන් බණ්ඩා යන අයට පහරදුන් බවට ඔහු විසින් නඟා ඇති සියලු චෝදනා අසත්‍ය බවත්, ඔහුව අත්අඩංගුවට ගත් අවස්ථාවේ ප්‍රතිරෝධය පෑම නිසා ඔහුහට තුවාල සිදුවූ බවත් තමා ඇතුළු නිලධාරී කණ්ඩායම විසින් ඔහුට කිසිදු පහරදීමක් සිදු කර නොමැති බවත් 1 වන වගඋත්තරකරු විසින් සිය දිවුරුම් ප්‍රකාශය තුළ තවදුරටත් සඳහන් කර ඇත.

<u>2 වන වගඋත්තරකරු වන පො.සැ.66560 පැතුම් යන අයගේ කරුණු දැක්වීම</u>

2 වන වගඋත්තරකරු වන පො.සැ. 66560 පැතුම් යන අය විසින් 2024.08.20 දිනැති දිවුරුම් ප්‍රකාශයක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර සිටින්නේ ඔහු ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ පොලිස් සැරයන්වරයෙකු ලෙස දැනට ගම්පොළ මූලස්ථාන පොලිස් ස්ථානයේ දූෂණ මර්ධන අංශයට අනුයුක්තව සේවය කරන බවත්, 2024.03.14 වන දින මූලස්ථාන පොලිස් පරීක්ෂකතුමාගේ නියෝග පරිදි පැය 17.50ට පො.ප. කුමාරසිංහ, පො.කො. 79375 චින්තක යන නිලධාරීන් සමග අංක WP ABV 2584 දරණ ත්‍රීවීල් රථයෙන් වැටලීම් රාජකාරි සඳහා ගම්පොළ නගරයට පිටත්ව ගිය බවත් ය.

එසේම, ඉහත කී නිලධාරීන් සමඟ ගම්පොළ නගරයේ කීරපන හා කහටපිටිය යන ප්‍රදේශ වල සංචාරය කරමින් සිටියදී පැය 18.20ට ගම්පොළ ඔරියවත්ත ප්‍රදේශයේ ගංජා ලඟතබා ගෙන සිටින පුද්ගලයෙක් පිළිබඳව පුද්ගලික ඔත්තුකරුවකුගෙන් පො.ප. කුමාරසිංහ නිලධාරියා වෙත තොරතුරක් ලැබුණු බවත්, ඒ අනුව නිලධාරීන් කණ්ඩායම මරියවත්ත ප්‍රදේශයට පිටව ගිය බවත්, එහිදී නිශ්කාර්ගේ පළතුරු කඩේ අසළ සිටියදී පැය 20.30ට ගංජා ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 700 ලඟතබා ගත් වරදට ගම්පොළ, මරියවත්ත, අංක බී /4හි පදිංචි කමල් අතුල සෙනෙවිරත්න නොහොත් ලොක්කෙ යන සැකකරුව වරද කියාදී පො.ප. කුමාරසිංහ නිලධාරියා විසින් අත්අඩංගුවට ගත් බවත්, එම සැකකරුගෙන් වැඩිදුරටත් ප්‍රශ්න කිරීමේදී ඔහුගේ මස්සිනා වන හේරත් මුදයන්සේලාගේ ඉලංගකෝන් බණ්ඩා හෙවත් මජී යන අය හොරොයින් ජාවාරමේ නිරත වන බවට කරුණු අනාවරණය කරගත් බවත් 2 වන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත.

තවද, ඉහත කී සැකකරුගෙන් ලද තොරතුරු මත පො.ප. කුමාරසිංහ, පො.කො. 79375 චින්තක සහ පො.කො. 103735 ජයසිංහ යන නිලධාරීන් සමග තමා ගම්පොළ, මරියවත්ත, බී/ 4 යන ලිපිනයේ පදිංචි හේරත් මුදියන්සේලාගේ ඉලංගකොන් බණ්ඩා හෙවත් මජී පරික්ෂා කිරීම සඳහා ඔහුගේ නිවස තුළට ඇතුළු වූ බවත්, එම අවස්ථාවේදී ඉලංගකෝන් බණ්ඩා යන සැකකරු නිවසේ සාලයේ සිටි බවත්, පො.ප. කුමාරසිංහ නිලධාරියා විසින් ඔවුන් ගම්පොළ පොලිස් ස්ථානයේ නිලධාරීන් බවට ප්‍රකාශ කරන ලද බවත්, ඉලංගකෝන් බණ්ඩා යන සැකකරුව පො.ප. කුමාරසිංහ නිලධාරියා විසින් පරික්ෂා කිරීමේදී ඔහුගේ කලිසමේ ඉදිරිපිට දකුණු සාක්කුවේ තිබූ රෝස පාට ෂොපින් කැබැල්ලක ඔතන ලද කුඩා පාර්සලයක් සොයාගත් බවත්, එය හෙරොයින් ලෙස පො.ප. කුමාරසිංහ නිලධාරියා විසින් හඳුනාගත් බවත් 2 වන වගඋත්තරකරු විසින් සිය දිවුරුම් ප්‍රකාශය තුළ සඳහන් කර ඇත.

ඒ අනුව පො.ප. කුමාරසිංහ නිලධාරියා විසින් හෙරොයින් තබාගත් වරද කියාදී හේරත් මුදියන්සේලාගේ ඉලංගකෝන් බණ්ඩා යන සැකකරු ප.ව. 20.45ට ඔහුගේ නිවස තුළදී අත්අඩංගුවට ගත් බවත්, එම අවස්ථාවේදී එකී සැකකරු පො.ප. කුමාරසිංහ නිලධාරියාගේ ටීෂර්ට් එකෙන් අල්ලා ප්‍රතිරෝධය පෑ බවත්, පසුව සැකකරු නිවසේ සාලයේ තිබූ පුටුවක් බදාගෙන පුටුවේ ඔළුව හප්පාගත් බවත්, නිලධාරීන්ට පයින් ගසා තල්ලු කර පළායාමට උත්සාහ කළ බවත්, තමා ඇතුළු නිලධාරී කණ්ඩායම මහත් පරිශ්‍රමයක් දරා ඉහත කී සැකකරු සහ ඔහුගේ මස්සිනා වන අතුල යන අයව නිලධාරීන් පැමිණි ත්‍රීවීල් රථයට නංවාගෙන පොලිස් ස්ථානය වෙත රැගෙන ආ බවත් 2 වන වගඋත්තරකරු විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

එලෙස අත්අඩංගුවට ගන්නා ලද සැකකරු වන ඉලංගකෝන් බණ්ඩා යන අයගේ ප්‍රකාශයක් තමා විසින් සටහන් කරගත් බවත්, එම ප්‍රකාශය තුළින් එකී සැකකරු හෙරොයින් ජාවාරමේ නිරත වන බවට පිළිගෙන ඇති බවත්, එකී සැකකරු 2024.03.15 වන දින නඩු අංක බී/321/24 යටතේ ගම්පොළ මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද බවත්, පසුව අධිකරණය මගින් ඔහුව අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කළ බවත් 2 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත.

තවද, තමා ඇතුළු නිලධාරී කණ්ඩායම විසින් ඉහත කී සැකකරු වන ඉලංගකෝන් බණ්ඩා යන අයට පහරදුන් බවට ඔහු විසින් නඟා ඇති සියලු චෝදනා අසත්‍ය බවත්, ඔහුව අත්අඩංගුවට ගත් අවස්ථාවේ ප්‍රතිරෝධය පෑම නිසා ඔහුහට තුවාල සිදුවූ බවත්, තමා ඇතුළු නිලධාරී කණ්ඩායම විසින් ඔහුට කිසිදු පහරදීමක් සිදු කර නොමැති බවත් 2 වන වගඋත්තරකරු විසින් සිය දිවුරුම් ප්‍රකාශය තුළ තවදුරටත් සඳහන් කර ඇත.

**<u>3 වන වගඋත්තරකරු වන පො.කො.79375 චින්තක යන අයගේ කරුණු දැක්වීම</u>**

3 වන වගඋත්තරකරු වන පො.කො.79375 චින්තක යන අය විසින් 2024.08.20 දිනැති දිවුරුම් ප්‍රකාශයක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර සිටින්නේ ඔහු ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ පොලිස් කොස්තාපල්වරයෙකු ලෙස දැනට ගම්පොළ මූලස්ථාන පොලිස් ස්ථානයේ

දූෂණ මර්ධන අංශයට අනුයුක්තව සේවය කරන බවත්, 2024.03.14 වන දින මූලස්ථාන පොලිස් පරීක්ෂකතුමාගේ නියෝග පරිදි පැය 17.50ට පො.ප. කුමාරසිංහ, පො.සැ. 66560 පැතුම් යන නිලධාරීන් සමග අංක WP ABV 2584 දරණ ත්‍රීවීල් රථයෙන් වැටලීම් රාජකාරි සඳහා ගම්පොළ නගරයට පිටත්ව ගිය බවත් ය.

එසේම, ඉහත කී නිලධාරීන් සමඟ ගම්පොළ නගරයේ කීරපන හා කහටපිටිය යන ප්‍රදේශ වල සංචාරය කරමින් සිටියදී පැය 18.20ට ගම්පොළ මරියවත්ත ප්‍රදේශයේ ගංජා ළඟතබා ගෙන සිටින පුද්ගලයෙක් පිළිබඳව පුද්ගලික ඔත්තුකරුවකුගෙන් පො.ප. කුමාරසිංහ නිලධාරියා වෙත තොරතුරක් ලැබුණු බවත්, ඒ අනුව නිලධාරීන් කණ්ඩායම මරියවත්ත ප්‍රදේශයට පිටව ගිය බවත්, එහිදී නිශ්කාර්ගේ පළතුරු කඩේ අසළ සිටියදී පැය 20.30ට ගංජා ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 700 ළඟතබා ගත් වරදට ගම්පොළ, මරියවත්ත, අංක බී /4හි පදිංචි කමල් අතුල සෙනෙවිරත්න නොහොත් ලොක්කෙ යන සැකකරුව වරද කියාදී පො.ප. කුමාරසිංහ නිලධාරියා විසින් අත්අඩංගුවට ගත් බවත්, එම සැකකරුගෙන් වැඩිදුරටත් ප්‍රශ්න කිරීමේදී ඔහුගේ මස්සිනා වන හේරත් මුදයන්සේලාගේ ඉලංගකෝන් බණ්ඩා හෙවත් මජී යන අය හෙරොයින් ජාවාරමේ නිරත වන බවට කරුණු අනාවරණය කරගත් බවත් 3 වන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත.

තවද, ඉහත කී සැකකරුගෙන් ලද තොරතුරු මත පො.ප. කුමාරසිංහ, පො.සැ.66560 පැතුම් සහ පො. කො. 103735 ජයසිංහ යන නිලධාරීන් සමග තමා ගම්පොළ, මරියවත්ත, බී/ 4 යන ලිපිනයේ පදිංචි හේරත් මුදියන්සේලාගේ ඉලංගකොන් බණ්ඩා හෙවත් මජී පරික්ෂා කිරීම සඳහා ඔහුගේ නිවස තුළට ඇතුළු වූ බවත්, එම අවස්ථාවේදී ඉලංගකෝන් බණ්ඩා යන සැකකරු නිවසේ සාලයේ සිටි බවත්, පො.ප. කුමාරසිංහ නිලධාරියා විසින් ඔවුන් ගම්පොළ පොලිස් ස්ථානයේ නිලධාරීන් බවට ප්‍රකාශ කරන ලද බවත්, ඉලංගකෝන් බණ්ඩා යන සැකකරුව පො.ප. කුමාරසිංහ නිලධාරියා විසින් පරික්ෂා කිරීමේදී ඔහුගේ කලිසමේ ඉදිරිපිට දකුණු සාක්කුවේ තිබූ රෝස පාට ෂොපින් කැබැල්ලක ඔතන ලද කුඩා පාර්සලයක් සොයාගත් බවත්, එය හෙරොයින් ලෙස පො.ප. කුමාරසිංහ නිලධාරියා විසින් හඳුනාගත් බවත් 3 වන වගඋත්තරකරු විසින් සිය දිවුරුම් ප්‍රකාශය තුළ සඳහන් කර ඇත.

ඒ අනුව පො.ප. කුමාරසිංහ නිලධාරියා විසින් හෙරොයින් තබාගත් වරද කියාදී හේරත් මුදියන්සේලාගේ ඉලංගකෝන් බණ්ඩා යන සැකකරු ප.ව. 20.45ට ඔහුගේ නිවස තුළදී අත්අඩංගුවට ගත් බවත්, එම අවස්ථාවේදී එකී සැකකරු පො.ප. කුමාරසිංහ නිලධාරියාගේ ටීෂර්ට් එකෙන් අල්ලා ප්‍රතිරෝධය පෑ බවත්, පසුව සැකකරු නිවසේ සාලයේ තිබූ පුටුවක් බදාගෙන පුටුවේ ඔළුව හප්පාගත් බවත්, නිලධාරීන්ට පයින් ගසා තල්ලු කර පළායාමට උත්සාහ කළ බවත්, තමා ඇතුළු නිලධාරී කණ්ඩායම මහත් පරිශ්‍රමයක් දරා ඉහත කී සැකකරු සහ ඔහුගේ මස්සිනා වන අතුල යන අයව නිලධාරීන් පැමිණි ත්‍රීවීල් රථයට නංවාගෙන පොලිස් ස්ථානය වෙත රැගෙන ආ බවත් 3 වන වගඋත්තරකරු විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

එලෙස අත්අඩංගුවට ගන්නා ලද සැකකරු වන ඉලංගකෝන් බණ්ඩා යන අයගේ ප්‍රකාශයක් තමා විසින් සටහන් කරගත් බවත්, එම ප්‍රකාශය තුළින් එකී සැකකරු හෙරොයින් ජාවාරමේ නිරත වන බවට පිළිගෙන ඇති බවත්, එකී සැකකරු 2024.03.15 වන දින නඩු අංක බී/321/24 යටතේ ගම්පොළ මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද බවත්, පසුව අධිකරණය මගින් ඔහුව අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කළ බවත් 3 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත.

තවද, තමා ඇතුළු නිලධාරී කණ්ඩායම විසින් ඉහත කී සැකකරු වන ඉලංගකෝන් බණ්ඩා යන අයට පහරදුන් බවට ඔහු විසින් නඟා ඇති සියලු චෝදනා අසත්‍ය බවත්, ඔහුව අත්අඩංගුවට ගත් අවස්ථාවේ ප්‍රතිරෝධය පෑම නිසා ඔහුහට තුවාල සිදුවූ බවත්, තමා ඇතුළු නිලධාරී කණ්ඩායම විසින් ඔහුට කිසිදු පහරදීමක් සිදු කර නොමැති බවත් 3 වන වගඋත්තරකරු විසින් සිය දිවුරුම් ප්‍රකාශය තුළ තවදුරටත් සඳහන් කර ඇත.

<u>4 වන වගඋත්තරකරු වන පො.කො.103735 ජයසිංහ යන අයගේ කරුණු දැක්වීම</u>

4 වන වගඋත්තරකරු වන පො.කො.103735 ජයසිංහ යන අය විසින් 2024.08.20 දිනැති දිවුරුම් ප්‍රකාශයක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර සිටින්නේ ඔහු ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ පොලිස් කොස්තාපල්වරයෙකු ලෙස දැනට ගම්පොළ මූලස්ථාන පොලිස් ස්ථානයේ දූෂණ මර්ධන අංශයට අනුයුක්තව සේවය කරන බවත්, 2024.03.14 වන දින පැය 18.20ට තම පෞද්ගලික යතුරු පැදියෙන් ගම්පොළ රෝහල අසලට පැමිණෙන ලෙස පො.ප. කුමාරසිංහ නිලධාරියා විසින් දැනුම්දුන් බවත්, තමා ගම්පොළ රෝහල අසලට පැමිණි පසු වැටලීම් කටයුතු සඳහා මරියවත්ත ප්‍රදේශයට පෞද්ගලික යතුරු පැදියෙන් පැමිණෙන ලෙස දැනුම් දුන් බවත් ය.

එසේම, පො.ප. කුමාරසිංහ නිලධාරියා ඇතුළු නිලධාරීන් විසින් ගම්පොළ නගරයේ කීරපන හා කහටපිටිය යන ප්‍රදේශ වල සංචාරය කරමින් සිටියදී පැය 18.20ට ගම්පොළ මරියවත්ත ප්‍රදේශයේ ගංජා ළඟතබා ගෙන සිටින පුද්ගලයෙක් පිළිබඳව පුද්ගලික ඔත්තුකරුවකුගෙන් පො.ප. කුමාරසිංහ නිලධාරියා වෙත තොරතුරක් ලැබී ඇති බවත්, ඒ අනුව තමා ද ඇතුළුව නිලධාරීන් කණ්ඩායම මරියවත්ත ප්‍රදේශයට පිටව ගිය බවත්, එහිදී නිශ්කාර්ගේ පළතුරු කඩේ අසළ සිටියදී පැය 20.30ට ගංජා ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 700 ළඟතබා ගත් වරදට ගම්පොළ, මරියවත්ත, අංක බී/4හි පදිංචි කමල් අතුල සෙනෙවිරත්න නොහොත් ලොක්කෙ යන සැකකරුව වරද කියාදී පො.ප. කුමාරසිංහ නිලධාරියා විසින් අත්අඩංගුවට ගත් බවත්, එම සැකකරුගෙන් වැඩිදුරටත් ප්‍රශ්න කිරීමේදී ඔහුගේ මස්සිනා වන හේරත් මුදයන්සේලාගේ ඉලංගකෝන් බණ්ඩා හෙවත් මජී යන අය හොරොයින් ජාවාරමේ නිරත වන බවට කරුණු අනාවරණය කරගත් බවත් 4 වන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත.

තවද, ඉහත කී සැකකරුගෙන් ලද තොරතුරු මත පො.ප. කුමාරසිංහ, පො.සැ.66560 පැතුම් සහ පො. කො. 79375 චින්තක යන නිලධාරීන් සමග තමා ගම්පොළ, මරියවත්ත, බී/ 4 යන ලිපිනයේ පදිංචි හේරත් මුදියන්සේලාගේ ඉලංගකොන් බණ්ඩා හෙවත් මජී පරික්ෂා කිරීම සඳහා ඔහුගේ නිවස තුළට

ඇතුළු වූ බවත්, එම අවස්ථාවේදී ඉලංගකෝන් බණ්ඩා යන සැකකරු නිවසේ සාලයේ සිටි බවත්, පො.ප. කුමාරසිංහ නිලධාරියා විසින් ඔවුන් ගම්පොළ පොලිස් ස්ථානයේ නිලධාරීන් බවට ප්‍රකාශ කරන ලද බවත්, ඉලංගකෝන් බණ්ඩා යන සැකකරුව පො.ප. කුමාරසිංහ නිලධාරියා විසින් පරීක්ෂා කිරීමේදී ඔහුගේ කලිසමේ ඉදිරිපිට දකුණු සාක්කුවේ තිබූ රෝස පාට ෂොපින් කැබැල්ලක ඔතන ලද කුඩා පාර්සලයක් සොයාගත් බවත්, එය හෙරොයින් ලෙස පො.ප. කුමාරසිංහ නිලධාරියා විසින් හඳුනාගත් බවත් 4 වන වගඋත්තරකරු විසින් සිය දිවුරුම් ප්‍රකාශය තුළ සඳහන් කර ඇත.

ඒ අනුව පො.ප. කුමාරසිංහ නිලධාරියා විසින් හෙරොයින් තබාගත් වරද කියාදී හේරත් මුදියන්සේලාගේ ඉලංගකෝන් බණ්ඩා යන සැකකරු ප.ව. 20.45ට ඔහුගේ නිවස තුළදී අත්අඩංගුවට ගත් බවත්, එම අවස්ථාවේදී එකී සැකකරු පො.ප. කුමාරසිංහ නිලධාරියාගේ ටීෂර්ට් එකෙන් අල්ලා ප්‍රතිරෝධය පෑ බවත්, පසුව සැකකරු නිවසේ සාලයේ තිබූ පුටුවක් බදාගෙන පුටුවේ ඔළුව හප්පාගත් බවත්, නිලධාරීන්ට පයින් ගසා තල්ලු කර පළායාමට උත්සාහ කළ බවත්, තමා ඇතුළු නිලධාරී කණ්ඩායම මහත් පරිශ්‍රමයක් දරා ඉහත කී සැකකරු සහ ඔහුගේ මස්සිනා වන අතුල යන අයව නිලධාරීන් පැමිණි ත්‍රීවීල් රථයට නංවාගෙන පොලිස් ස්ථානය වෙත රැගෙන ආ බවත් 4 වන වගඋත්තරකරු විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

එලෙස අත්අඩංගුවට ගන්නා ලද සැකකරු වන ඉලංගකෝන් බණ්ඩා යන අයගේ ප්‍රකාශයක් පො.සැ.66560 පැතුම් යන නිලධාරියා විසින් සටහන් කරගත් බවත්, එම ප්‍රකාශය තුළින් එකී සැකකරු හෙරොයින් ජාවාරමේ නිරත වන බවට පිළිගෙන ඇති බවත්, එකී සැකකරු 2024.03.15 වන දින නඩු අංක බී/321/24 යටතේ ගම්පොළ මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද බවත්, පසුව අධිකරණය මගින් ඔහුව අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කළ බවත් 4 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත.

තවද, පොලිස් නිලධාරීන් විසින් ඉහත කී සැකකරු වන ඉලංගකෝන් බණ්ඩා යන අයට පහරදුන් බවට ඔහු විසින් නඟා ඇති සියලු චෝදනා අසත්‍ය බවත්, ඔහුව අත්අඩංගුවට ගත් අවස්ථාවේ ප්‍රතිරෝධය පෑම නිසා ඔහුහට තුවාල සිදුවූ බවත්, පොලිස් නිලධාරීන් විසින් ඔහුට කිසිඳු පහරදීමක් සිදු කර නොමැති බවත් 4 වන වගඋත්තරකරු විසින් සිය දිවුරුම් ප්‍රකාශය තුළ තවදුරටත් සඳහන් කර ඇත.

**<u>5 වන වගඋත්තරකරු වන ගම්පොළ පොලිස් ස්ථානයේ මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක බී.ඩී.පී. ලක්සිරි ප්‍රනාන්දු යන අයගේ කරුණු දැක්වීම</u>**

5 වන වගඋත්තරකරු වන ගම්පොළ පොලිස් ස්ථානයේ මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක විසින් 2024.04.21 දිනැති වාර්තාව ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ, 2024.03.14 දින ස්ථානාධිපති දූෂණ මර්ධන අංශයේ පො.ප. කුමාරසිංහ නිලධාරියාට ලද තොරතුරකට අනුව එම නිලධාරියා ඇතුළු අංශයේ නිලධාරීන් කණ්ඩායම විසින් මෙම වැටලීම සිදු කිරීමට යාමේදී අංක බී 4, මරියාවත්ත, ගම්පොල ලිපිනයේ පදිංචි උයන්වත්තේ ගෙදර කමල් අතුල සෙනෙවිරත්න ගංජා මිලිග්‍රෑම් 10700ක් ලඟ තබා

ගැනීමේ වරදට අත් අඩංගුවට ගෙන ඇති බවත්, එම අවස්ථාවේදී මෙම සැකකරුගෙන් දීර්ඝ ලෙස ප්‍රශ්න කිරීමේදී සැකකරුගේ මස්සිනා වන මජී නොහොත් අංක බී 4, මරියාවත්ත, ගම්පොල ලිපිනයේ පදිංචි හේරත් මුදියන්සේලාගේ ඉලංගකෝන් බණ්ඩා යන අය හෙරොයින් ජාවාරම සිදු කරන බවට ප්‍රකාශ කර ඇති බවත්, එම අවස්ථාවේදී අත්අඩංගුවට ගත් සැකකරුගේ මග පෙන්වීම මත මජී නොහොත් ඉලංගකෝන් බණ්ඩා යන අය හෙරොයින් ජාවාරම සිදු කිරීමට අදාල වැටලීම සිදුකිරීම සඳහා පිටව ගොස් ඇති බවත් ය.

මෙම නිලධාරීන් කණ්ඩායම ඉහත සැකකරුගේ නිවසට යන අවස්ථාවේදී මජී නොහොත් ඉලංගකෝන් බණ්ඩා යන අය නිවසේ සිට ඇති අතර, පො.ප.කුමාරසිංහ නිලධාරියා විසින් ගම්පොල පොලිසියෙන් බව පවසා සැකකරු පරීක්ෂා කර ඇති බවත්, එම අවස්ථාවේදී සැකකරු ඇඳ සිටි කොට කලිසමේ ඉදිරි දකුණු සාක්කුවේ පාර්සලයක් තිබී හමුවී ඇති බවත්, එම පාර්සලය පො.ප.කුමාරසිංහ නිලධාරියා විසින් පරීක්ෂා කරන අවස්ථාවේදී පාර්සලයේ හෙරොයින් අඩංගු බවට හඳුනාගෙන ඇති බවත් එකී වාර්තාව ප්‍රකාරව 5 වන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත.

අනතුරුව මෙම සැකකරු පො.ප.කුමාරසිංහ නිලධාරියා ඇතුළු නිලධාරීන් විසින් අත්අඩංගුවට ගැනීමට යන අවස්ථාවේදී සැකකරු නිලධාරියාගේ ග්‍රහණයෙන් මිදී පලා යාමට උත්සහ කර ඇති බවත්, එම අවස්ථාවේදී නිලධාරීන් පිරිස විසින් දැඩි පරිශ්‍රමයක් දරා සැකකරු අල්ලා ගැනීමට උත්සහ කිරීමේදී සැකකරු නිවසේ සාලයේ තිබූ පුටුවක් බදාගෙන සිට එම පුටුවේ සැකකරුගේ ඔළුව ගසාගෙන ඇති බවත්, ඒ අවස්ථාවේදී නිලධාරීන් විසින් සැකකරු අල්ලාගෙන ත්‍රීවිල් රථයෙන් පොලිස්ථානයට රැගෙන විත් සැකකරු ඉදිරියේ උප සේවයේ ඇති ඉලෙක්ට්‍රොනික් තරාදියෙන් හෙරෝයින් පාර්සලය කිරා බැලීමේදී හෙරොයින් මිලිග්‍රෑම් 2100ක් තිබී ඇති බවත් 5 වන වගඋත්තරකරු විසින් සිය වාර්තාවේ සඳහන් කර ඇත.

ගංජා මිලිග්‍රෑම් 10700ක් ලඟ තබා ගැනීමේ වරදට අත්අඩංගුවට ගත් අංක බී 4, මරියාවත්ත, ගම්පොළ ලිපිනයේ පදිංචි උයන්වත්තේ ගෙදර කමල් අතුල සෙනෙවිරත්න වන අය 2024.03.15 වෙනි දින ගම්පොල ම/උ 46691/24 යටතේ ගරු අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු රු 5000.00ක දඩයකට යටත් කර ඇති බවත්, පසුව අංක බී 4,මරියාවත්ත,ගම්පොල ලිපිනයේ පදිංචි හේරත් මුදියන්සේලාගේ ඉලංගකෝන් බණ්ඩා නොහොත් මජී යන අය හෙරොයින් ජාවාරම සිදුකරමින් හෙරොයින් මිලිග්‍රෑම් 2100 ක් ළඟ තබා ගැනීමට අදාලව අත් අඩංගුවට ගෙන 1984 අංක 13 දරණ අන්තරාදායක විෂ මත්ද්‍රව්‍ය ආඥා පනතේ 54(1) (අ) (ආ) (ඇ) යටතේ 2024.03.15 වන දින ම/උ බි 321/24 යටතේ ගරු ගම්පොළ මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති බවත් 5 වන වගඋත්තරකරු විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

නිරීක්ෂණ

ගම්පොළ මූලස්ථාන පොලිස් ස්ථානයේ දූෂණ වැටලීම් තොරතුරු සටහන් පොතේ 2024.03.14 වන දින පැය 05.50ට පිටුව 167 සහ ඡේදය 118 හි යොදා ඇති සටහන අනුව 1 වන වගඋත්තරකරු වන පො.ප. කුමාරසිංහ, 2 වන වගඋත්තරකරු වන පො.සැ.66560 පැතුම්, 3 වන වගඋත්තරකරු වන පො. කො.79375 චින්තක යන නිලධාරීන් 5 වන වගඋත්තරකරු වන මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂකගේ නියෝග පරිදි වැටලීම් රාජකාරී සඳහා පිටත්ව ගොස් ඇති බව නිරීක්ෂණය වේ.

එසේම, වැටලීම් රාජකාරි සඳහා සංචාරය කරමින් සිටින අතරතුර ලද තොරතුරකට අනුව ගම්පොළ මරියවත්ත ප්‍රදේශයට ගිය බවත්, එහිදී පැය 20.30ට පමණ කැනබීස් සැටයිවා එල් ළඟතබා ගැනීමේ වරදට වරද කියා දී මරියාවත්ත, නිශ්කාර්ගේ පලතුරු කඩය අසලදී අංක බී/4, මරියවත්ත, ගම්පොල ලිපිනයේ පදිංචි උයන්වත්තේ ගෙදර කමල් අතුල සෙනෙවිරත්න යන අය අත්අඩංගුවට ගෙන ඔහුගෙන් ප්‍රශ්න කිරීමේ දී ලැබුණු තොරතුරු අනුව ඔහුගේ මස්සිනා වන මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය හෙරොයින් පාර්සලයක් රැගෙන ආ බවට තොරතුරු ලැබීමෙන් පසු ඉහත කී උයන්වත්තේ ගෙදර කමල් අතුල සෙනෙවිරත්න යන අය සමඟ වින්දිත තැනැත්තාගේ නිවසට ගොස් රාත්‍රී 08.45 ට පමණ වින්දිත තැනැත්තාගේ සන්තකයේ තිබී හෙරොයින් හමුවීමෙන් පසු වින්දිත තැනැත්තා අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයට රැගෙන විත් වින්දිත තැනැත්තා ඉදිරියේ අදාළ හෙරොයින් කිරා බැලීමේදී හෙරොයින් මිලිග්‍රෑම් 2100ක් තිබීම හේතුවෙන් එයට මුද්‍රා තබා නඩු බඩු කුවිතාන්සි අංක 761/2024 යටතේ ඇතුළත් කළ බවත් ඉහත සඳහන් කරන ලද ගම්පොළ මූලස්ථාන පොලිස් ස්ථානයේ දූෂණ වැටලීම් තොරතුරු සටහන් පොතේ 2024.03.14 වන දින පැය 23.15ට පිටුව 184 සහ ඡේදය 133 යටතේ යොදන ලද සටහනෙහි වැඩිදුරටත් දක්වා ඇත.

එසේවුවද, වින්දිත පාර්ශවය විසින් කොමිෂන් සභාව වෙත 2024.07.08 වන දිනැතිව ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශය මඟින් කියා සිටින්නේ ඔහු සතුව කිසිදු මත්ද්‍රව්‍යයක් නොතිබූ බවත්, වගඋත්තරකාර පාර්ශවය විසින් කිසිදු හේතුවක් නොමැතිව තමා හට පහර දී තමාව අත්අඩංගුවට ගෙන අසත්‍ය චෝදනාවක් වන ඩයිසැටයිල් මෝෆින් හෙවත් හෙරොයින් මිලිග්‍රෑම් 2100ක් ජාවාරම් කරමින් ළඟ තබා ගැනීමේ වරද මත අංක B/321/24 යටතේ 2024.03.15 දින ගම්පොල මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද බවත් ය.

තවද, වින්දිත පාර්ශවය සතුව හෙරොයින් ඇති බවට තොරතුරු ලබා දී ඇති බවට වගඋත්තරකාර පාර්ශවය විසින් පවසන වින්දිත තැනැත්තාගේ බිරිඳගේ සහෝදරයා වන උයන්වත්තේ ගෙදර කමල් අතුල සෙනෙවිරත්න යන අය විසින් 2025.04.01 දිනැති දිවුරුම් ප්‍රකාශයක් කොමිෂන් සභාව වෙත යොමු කරමින් ප්‍රකාශ කර ඇත්තේ 2024.03.14 වන දින රාත්‍රී 8.30ට පමණ රතු පාට ත්‍රීරෝද රථයකින් පැමිණි සිවිල් ඇඳුමෙන් සැරසුණු පුද්ගලයන් තිදෙනෙකු විසින් ඔහුගේ නිවස ඉදිරිපිට මාර්ගයේදී ඔහුව අත්අඩංගුවට ගත් බවත්, එසේ පැමිණි පිරිස පොලිස් නිලධාරීන් බව ඔහු දැනගත් බවත්, ඔහුගේ කාමරය

පරීක්ෂා කිරීමට අවශ්‍ය බව පවසා එකී පොලිස් නිලධාරීන් තිදෙනා අතර සිටි පැතුම් යන නිලධාරියා පමණක් නිවස තුළට ගිය බවත් ය.

එසේම, එකී පොලිස් නිලධාරීන් විසින් තමා අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී තමාගෙන් කිසිදු ප්‍රශ්න කිරීමක් සිදු නොකළ බවත්, තම මස්සිනා වන මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය වන ඉලංගකෝන් බණ්ඩා යන අය සම්බන්ධයෙන් කිසිවක් නොඇසූ බවත්, වගඋත්තරකාර නිලධාරීන් පවසන ආකාරයට තම මස්සිනා වන ඉලංගකෝන් බණ්ඩා යන අය හෙරොයින් ජාවාරම සිදු කරන බවට කිසිදු ප්‍රකාශයක් තමා විසින් සිදු කර නොමැති බවත්, තමා එසේ පැවසූ බවට වගඋත්තරකාර නිලධාරීන් විසින් සිදු කරන ප්‍රකාශ සම්පූර්ණයෙන්ම අසත්‍ය ප්‍රකාශයක් බව තමා තරයේ ප්‍රකාශ කර සිටින බවත්, එකී නිලධාරීන් අතරින් 1 වන වගඋත්තරකරු වන පො.ප. කුමාරසිංහ සහ 2 වන වගඋත්තරකරු වන පො.සැ. 66560 පැතුම් යන නිලධාරීන් දෙදෙනා විසින් තම මස්සිනා වන ඉලංගකෝන් බණ්ඩා යන අය හට පහර දුන්නා මිස කිසිම අවස්ථාවකදී මස්සිනාව පරීක්ෂා කිරීමක් සිදු නොකළ බවත්, නිවසට ගොස් තම කාමරය පමණක් පරීක්ෂා කළ බවත් වින්දිත තැනැත්තාගේ බිරිඳගේ සහෝදරයා වන උයන්වත්තේ ගෙදර කමල් අතුල සෙනෙවිරත්න යන අය විසින් සිය දිවුරුම් ප්‍රකාශය තුළ සඳහන් කර ඇත.

ඒ අනුව සලකා බැලීමේ දී වගඋත්තරකාර පාර්ශවය වෙත වින්දිත තැනැත්තා අත්අඩංගුවට ගැනීම සඳහා සාධාරණ හේතුවක් පැවතියේ ද යන්න ගැටලුකාරී වන බව කොමිෂන් සභාව වෙත නිරීක්ෂණය වේ. කෙසේවෙතත් වින්දිත පාර්ශවය සතුව හෙරොයින් මත්ද්‍රව්‍ය තිබූ බවත්, ඔහු ඉදිරිපිටදී එහි ප්‍රමාණය මැන බැලූ බවටත් වගඋත්තරකාර පාර්ශවය විසින් අධිකරණය වෙත කරුණු වාර්තා කර ඇති බැවින් සහ එකී නඩුව තවමත් ගම්පොල මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වෙමින් පවතින බැවින් සහ කොමිෂන් සභාව වෙත ප්‍රමාණවත් සාක්ෂි ලැබී නොමැති බැවින් වින්දිත තැනැත්තා අත්අඩංගුවට ගැනීමේ නීත්‍යානුකූලභාවය සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් මේ අවස්ථාවේදී තීරණයක් ලබා දීමට කටයුතු නොකරයි.

තවද, 2024.03.15 දින අංක B/321/24 යටතේ වින්දිත පාර්ශවය ගම්පොල මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව වගඋත්තරකාර පොලිස් නිලධාරීන් විසින් තමා හට පහරදුන් බවට වින්දිත පාර්ශවය විසින් අධිකරණය වෙත කරුණු වාර්තා කිරීමෙන් අනතුරුව අධිකරණය විසින් නිකුත් කරන ලද නියෝගයක් අනුව වින්දිත තැනැත්තා ගම්පොල මූලික රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරී වෙත ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වේ.

අධිකරණ වෛද්‍ය පිරික්සන පෝරම අංක 186/2024 යටතේ ගම්පොල මූලික රෝහල් අධිකරණ වෛද්‍ය නිලධාරී විසින් වින්දිත තැනැත්තා 2024.03.15 දින ප.ව.02.30 ට පරීක්ෂා කර ඇති අතර එහිදී පහත සඳහන් පරිදි වින්දිත තැනැත්තාගේ ශරීරයේ ඇති තුවාල 17ක් පිළිබඳ නිරීක්ෂණය වූ බවට සටහන් තබා ඇත.

I. 3X3 cm ප්‍රමාණයේ තැලීමක් හිස්කබලේ දකුණු පස ඉදිරිපැත්තෙහි
II. 2X2 cm ප්‍රමාණයේ තැලීමක් බෙල්ලෙහි දකුණු පස ඉදිරිපැත්තෙහි

III. 3X1 cm ප්‍රමාණයේ තැලීම් 3ක් බෙල්ලෙහි තිරස් අතට ඉදිරිපැත්තෙහි
IV. 4X1 cm ප්‍රමාණයේ තැලීම් පපුවේ ඉහළ කොටසේ වම් පැත්තෙහි
V. 3cm ප්‍රමාණයේ රේඛීය සීරීමක් ඉහත අංක 04 දරණ තුවාලයට පාර්ශවික ලෙස
VI. 2X2 cm ප්‍රමාණයේ තැලීම් වම් බාහුවේ
VII. 0.5X0.5 cm ප්‍රමාණයේ සීරීමක් උඩු තොලේ වම් පැත්තෙහි
VIII. 5cm ප්‍රමාණයේ සීරීමක් වම් අතේ වැලමිට සන්ධියට පහලින්
IX. 2X2 cm ප්‍රමාණයේ සීරීමක් වම් පාදයේ වලලුකර මධ්‍යයේ
X. 1X1 cm ප්‍රමාණයේ සීරීමක් දකුණු පාදයේ වලලුකර පසුපස
XI. 15X4 cm ප්‍රමාණයේ තැලීම් පිටෙහි පසුපස ඉහල කොටසේ
XII. 8X4 cm ප්‍රමාණයේ තැලීම් දකුණු බාහුවේ පසුපස ඉහළ කොටසේ
XIII. 1X1 cm ප්‍රමාණයේ සීරීම් දකුණු උරහිසෙහි පසුපස කොටසේ
XIV. 6X4 cm ප්‍රමාණයේ තැලීම් දකුණුපස උරහිසෙහි ඉහල කොටසෙහි
XV. 5X2 cm ප්‍රමාණයේ තැලීම් වම් උරහිසෙහි පසුපස ඉහල කොටසෙහි
XVI. 2cm ප්‍රමාණයේ රේඛීය සීරීම් වම්පස බෙල්ලෙහි ඉහල කොටසෙහි
XVII. 4X2 cm ප්‍රමාණයේ තැලීම් වම්කනෙහි පහළ පිටුපස කොටසෙහි

එසේම, ඉහත කී තුවාල සියල්ල මොට අයුධයකින් සිදු වී ඇති බරපතළ නොවන තුවාල බව ද අධිකරණ වාර්තාවෙහි සඳහන්ව ඇත.

තවද, අධිකරණ වාර්තාවෙහි රෝගියා විසින් දෙන ලද කෙටි ඉතිහාසය තුළ '2024.03.14 රෑ 8ට පමණ පොලීස්යෙන් ඇවිත් ගෙදරදී මාව අත්අඩංගුවට ගත්තා. එවිට මට අතින්, පයින් ගැහුවා. ලී පොල්ලකින් කොන්දට ගැහුවා. බෙල්ල මිරිකුවා. පොලීසියට ගෙන ගියාට පසුවත් ලී පොල්ලකින් මට ගැහුවා. කොන්දට පයින් ගැහුවා', යනුවෙන් වින්දිත පාර්ශවය විසින් ලබා දෙන ලද ප්‍රකාශය සටහන් කර ඇති බව පෙනී යයි. ඒ අනුව වින්දිත තැනැත්තා විසින් පහරදුන් බවට සඳහන් කරන ලද ශරීරයේ ස්ථාන හා අධිකරණ වෛද්‍ය වාර්තාවේ තුවාල ඇති බවට සඳහන්ව ඇති ශරීරයේ ස්ථාන සන්සන්දනය කිරීමේදී ගැලපීමක් ඇති බවට නිරීක්ෂණය වේ.

තවද, ගම්පොල මුලස්ථාන පොලිස් ස්ථානයේ තොරතුරු සටහන් පොතේ 2024.03.14 වන දින පැය 23.15ට පිටුව184 සහ ඡේදය 133 යටතේ 1 වන වගඋත්තරකරු වන පො.ප. කුමාරසිංහ යන අය විසින් යොදා ඇති සටහන අනුව වින්දිත පාර්ශවය අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කරන ලද අවස්ථාවේදී සැකකරු පරීක්ෂා කළ බවත්, බාහිර තුවාල නොමැති බවත් සටහන් කර ඇති බව නිරීක්ෂණය වේ. එම සටහනට පහළින් පැය 23.40ට 2024.03.14 වන දින උප සේවය භාරව කටයුතු කළ පො.සැ. 45145 පියසේන නිලධාරියා විසින් වින්දිත තැනැත්තා පරීක්ෂා කර බැලූ අවස්ථාවේ දී ඔහු පපුවේ අමාරුවකට පෙති ලබා ගන්නා බව පැවසූ බවත්, කැ මොර ගසමින් සිටි බවත්, ප්‍රතිකාර ලබා දීමට

කටයුතු කළත් එය ප්‍රතික්ෂේප කළ බවත් සඳහන් කර ඇති නමුත්, වින්දිත තැනැත්තාගේ ශරීරයේ තුවාල ඇති බවට සටහනක් යොදා නොමැති බවත් පෙනී යයි.

එහෙත් වින්දිත පාර්ශවය අත්අඩංගුවට ගත් දිනට පසු දින එනම්, 2024.03.15 වන දින ගම්පොළ මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව නිකුත් කරන ලද අධිකරණ නියෝගය අනුව ගම්පොළ මූලික රෝහලේ අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කර ඇති අතර එහිදී ඉහතින් දක්වන ලද ආකාරයේ තුවාල 17ක ප්‍රමාණයක් වින්දිත තැනැත්තාගේ ශරීරයේ ඇති බවට අධිකරණ වෛද්‍යවරයා විසින් වින්දිත පාර්ශවයට අයත් අධිකරණ වෛද්‍ය වාර්තාව තුළ සඳහන් කර තිබීම තුළින් එකී සියලු තුවාල පොලිස් නිලධාරීන් භාරයේ අත්අඩංගුවේ සිටියදී සිදු වී ඇති තුවාල වන බවට තහවුරු වේ.

2024.07.31 වන දින මෙම පැමිණිල්ලට අදාළව කොමිෂන් සභාවේ පැවති පරීක්ෂණයේදී වගඋත්තරකාර නිලධාරීන් ප්‍රකාශ කර සිටින ලද්දේ වින්දිත පාර්ශවය අත්අඩංගුවට ගැනීමේදී හෝ ඉන් පසුව කිසිදු පහර දීමක් සිදුකර නොමැති බවයි. ඒ බව තහවුරු කිරීම සඳහා අදාල නිලධාරීන් විසින් දිවුරුම් ප්‍රකාශ ද ඉදිරිපත් කර ඇත.

1 වන වගඋත්තරකාර පො.ප.කුමාරසිංහ මහතා 2024.07.31 වන දින මෙම පැමිණිල්ලට අදාල කොමිෂන් සභාවේ පැවති පරීක්ෂණයේදී වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ වින්දිත පාර්ශවය අත්අඩංගුවට ගැනීමේදී ඔහු තමන්ව තල්ලුකර පලායාමට උත්සහ කළ බවත්, මහත් පරිශ්‍රමයක් දරා අත්අඩංගුවට ගත් බවත්, එහිදී අත්අඩංගුවට ගැනීම වැළැක්වීම සඳහා වින්දිත තැනැත්තා විසින් නිවසේ තිබූ පුටුවක ඔහුගේ ඔලුව ගසාගත් බවත් ය. 2 වන, 3වන සහ 4 වන වගඋත්තරකරුවන් විසින් ද 2024.08.20 දිනැතිව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශ තුළින් එකී කරුණු ඉදිරිපත් කර ඇත.

කෙසේ වෙතත් වගඋත්තරකාර පාර්ශවය විසින් ප්‍රකාශ කර ඇති පරිදි වින්දිත පාර්ශවය අත්අඩංගුවට ගැනීමේදී ඔහු විසින් හිස පමණක් නිවසේ තිබූ පුටුවක ගසාගත්තේ නම් ඔහුගේ හිසේ පමණක් තුවාලයක් තිබිය යුතු නමුත්, හිසේ හැර තවත් තුවාල 16ක් ශරීරයේ විවිධ ස්ථාන වල පවතින බව අධිකරණ වෛද්‍ය වාර්තාවේ සඳහන් වන බැවින් වින්දිත තැනැත්තා විසින් ප්‍රකාශ කර ඇති පරිදි ඔහු පහරදීමකට ලක්ව ඇති බව තහවුරු වේ.

එසේම, පැමිණිලිකාරිය විසින් 2024.05.28 දිනැතිව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශය මගින්ද කියා සිටින්නේ අදාළ සිද්ධිය වූ 2024.03.14 දින රාත්‍රී 8.45 ට පමණ තම නිවසේ තම කාමරය ඉදිරිපිටදී සිවිල් ඇඳුමින් සිටි පුද්ගලයෙකු තම ස්වාමි පුරුෂයා වන මෙම පැමිණිල්ලේ වින්දිත තැනැත්තා හට පහර දී පාරට ඇදගෙන ගිය බවත්, පාරේදී තවත් නිලධාරියෙකු විසින් පහර දීමෙන් පසු නිවසට ඇදගෙන විත් නැවත නිවසේදී ඔවුන් දෙදෙනා විසින් අතින් පයින් හා පොල්ලකින් තම ස්වාමි පුරුෂයා හට පහර දී නැවත ඇදගෙන ගොස් පාරේ තිබූ ජීප් රථයට නංවා ගෙන රැගෙන ගිය බවයි.

එමෙන්ම, වගඋත්තරකාර පාර්ශවය විසින් වින්දිත තැනැත්තා විසින් හෙරොයින් පාර්සලයක් රැගෙන ආ බවට තොරතුරු දුන් බවට පවසන වින්දිත තැනැත්තාගේ බිරිඳගේ සහෝදරයා වන කමල් අතුල

සෙනෙවිරත්න යන අය 2024.05.28 දිනැතිව කොමිෂන් සභාව වෙත දිවුරුම් ප්‍රකාශය ඉදිරිපත් කර ප්‍රකාශ කර ඇත්තේ 2024.03.14වන දින රාත්‍රී 08.45 ට පමණ තමන්ගේ මස්සිනා වන වින්දිත පාර්ශවය හට නිවස ඉදිරිපිට පාරේදී වගඋත්තරකාර පොලිස් නිලධාරීන් විසින් පහර දී ඉන්පසු නිවසට රැගෙන විත් නිවසේ දී පුටුවක හිඳුවා එක් නිලධාරියෙකු විසින් අතින් පහර දුන් බවත්, තව අයෙකු පොල්ලකින් පහරදීමෙන් පසු බිම දිගේ ඇදගෙන ගොස් ජීප් රථයට දමා ගත් බවයි.

ඒ අනුව ඉහතින් සඳහන් කර ඇති පරිදි වින්දිත තැනැත්තාගේ බිරිඳ වන පැමිණිලිකාරිය සහ බිරිඳගේ සහෝදරයා වන කමල් ඇතුල සෙනෙවිරත්න යන අය විසින් ලබා දී ඇති දිවුරුම් ප්‍රකාශයන් මගින්ද වින්දිත පාර්ශවය අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී වගඋත්තරකාර පොලිස් නිලධාරීන් අතරින් පොලිස් නිලධාරීන් දෙදෙනෙකු විසින් පහරදීම් සිදුකර ඇති බව තහවුරු වේ.

2024.07.31 වන දින මෙම පැමිණිල්ලට අදාල කොමිෂන් සභාවේ පැවති පරීක්ෂණයේදී පැමිණිලිකාරිය හා වින්දිත පාර්ශවය විසින් වින්දිත තැනැත්තා හට නිවසේදී පහරදුන් වගඋත්තරකාර නිලධාරීන් දෙදෙනා ලෙස 1 වන වගඋත්තරකරු වන පො.ප. කුමාරසිංහ සහ 2 වන වගඋත්තරකරු වන පො.සැ.66560 පැතුම් යන නිලධාරීන් හඳුනාගෙන ඇති බවත්, ගම්පොළ පොලිස් ස්ථානය වෙත රැගෙන යාමෙන් අනතුරුව පොලිස් ස්ථානය තුළ දී වින්දිත තැනැත්තා නිරුවත් කර පහර දුන් නිලධාරියා ලෙස 2 වන වගඋත්තරකරු වන පො.සැ.66560 පැතුම් යන නිලධාරියා හඳුනාගෙන ඇති බවත් නිරීක්ෂණය වේ.

තවද, වින්දිත තැනැත්තාගේ බිරිඳගේ සහෝදරයා වන උයන්වත්තේ ගෙදර කමල් අතුල සෙනෙවිරත්න යන අය විසින් 2025.04.01 දිනැති දිවුරුම් ප්‍රකාශයක් කොමිෂන් සභාව වෙත යොමු කරමින් ප්‍රකාශ කර ඇත්තේ ද ඔහු සහ වින්දිත තැනැත්තා පොලිස් ස්ථානය වෙත රැගෙන යාමෙන් අනතුරුව 2 වන වගඋත්තරකරු වන පො.සැ.66560 පැතුම් යන නිලධාරියා විසින් වින්දිත තැනැත්තා ඇඳ සිටි සියලු ඇඳුම් ගලවා යකඩ පොල්ලකින් කොන්දට ගසා රා කෑන් එකක් හිසේ සිට මුළු සිරුරටම හැලූ බවයි.

__නිගමනය__

ඉහත දක්වන ලද සියලු කරුණු සමස්තයක් ලෙස ගෙන සලකා බැලීමේදී 1 වන වගඋත්තරකරු විසින් වින්දිත පාර්ශවය වෙත ඔහුගේ නිවසේ දී පහරදීම් සිදු කර ඇති බවත්, 2 වන වගඋත්තරකරු විසින් වින්දිත පාර්ශවය වෙත ඔහුගේ නිවසේ දී මෙන්ම පොලිස් ස්ථානය තුළ දී ද අමානුෂික ලෙස පහරදීම් සිදු කර ඇති බවත්, එකී පහරදීම් හේතුවෙන් වින්දිත තැනැත්තාගේ ශරීරයේ විවිධ ස්ථාන වල තුවාල 17ක් දක්නට ලැබෙන බවත් වින්දිත පාර්ශවය වෙත නිකුත් කර ඇති අංක 186/2024 දරණ අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව තහවුරු වේ.

ඒ අනුව 1 වන සහ 2 වන වගඋත්තරකරුවන් විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කොට ඇති කිසිම තැනැත්තෙකු වධහිංසාවකට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැළකිල්ලකට නැතහොත් දඬුවමකට යටත්

යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු(හිටපු)
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් :- 01. අමාත්‍යතුමා
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල. - කරුණු දැනගැනීම සඳහා

02. පොලිස්පති
ශ්‍රී ලංකා පොලීසිය - අදාළ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා

සැ.යු. - අදාළ මුදල "මුදල් ඇණවුමක්" මගින් වින්දිත පාර්ශවය වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන්න.

නොකළ යුත්තේය යන වින්දිත පාර්ශවයේ මූලික අයිතිවාසිකම උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

එසේම, තමා යටතේ සිටින නිලධාරීන් නීතියට අනුව කටයුතු කරන්නේදැයි අධීක්ෂණය කිරීමට ස්ථානාධිපතිවරයා විෂයෙහි වගකීමක් පවතින බැවින් 5 වන වගඋත්තරකරු වන ගම්පොළ මූලස්ථාන පොලිස් ස්ථානයේ මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක, 1 වන සහ 2 වන වගඋත්තරකරුවන්ගේ ක්‍රියා කලාපය සම්බන්ධයෙන් අධීක්ෂණ වගකීමෙන් බැඳෙන බවත් මෙයින් නිගමනය කරනු ලැබේ.

තවද, 3 වන සහ 4 වන වගඋත්තරකරුවන් විසින් වින්දිත තැනැත්තා අත්අඩංගුවට ගැනීම සඳහා සහභාගී වී තිබුණ ද, එම නිලධාරීන් විසින් වින්දිත තැනැත්තා හට පහරදීම සිදු කර ඇති බවට කරුණු අනාවරණය නොවන් බැවින් මෙම සිද්ධියට අදාළව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් ඔවුන් වෙත වගකීමක් පැවරීමට කොමිෂන් සභාව අදහස් නොකරන බවත් මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශයන් ඉදිරිපත් කර සිටී.**

01. 01 වන වගඋත්තරකරු විසින් රුපියල් දසදහස (රු.10,000/-)ක මුදලක් වින්දිත පාර්ශවය වෙත වන්දි වශයෙන් ගෙවිය යුතු ය.

02. 02 වන වගඋත්තරකරු විසින් රුපියල් විසිපන්දහස (රු.25,000/-)ක මුදලක් වින්දිත පාර්ශවය වෙත වන්දි වශයෙන් ගෙවිය යුතු ය.

03. 1 වන, 2 වන සහ 5 වන වගඋත්තරකරුවන් මෙම සිදුවීමේදී ක්‍රියා කර ඇති ආකාරය පිළිබඳව පරීක්ෂණයක් පවත්වා සුදුසු පියවර ගැනීමට පොලිස්පතිවරයා විසින් කටයුතු කළ යුතු අතර, එලෙස ගනු ලබන පියවර සම්බන්ධයෙන් කොමිෂන් සභාව දැනුම්වත් කළ යුතු ය.

2025. 06. 24 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකාරිය විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය